රුහුණ විශ්වවිද්‍යාලය

සියලුම සිසුන්ගේ දැන ගැනීම සඳහා

නිවේදන අංක 01

**<u>2025/2026 අධ්‍යයන වර්ෂය සඳහා කළමණාකරණ හා මූල්‍ය පීඨ ශිෂ්‍ය සමිතිය පිහිටුවීම පිළිබඳ නිවේදනය</u>**

1990 අංක 01 දරණ විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිති හා පීඨ ශිෂ්‍ය සමිති අතුරු ව්‍යවස්ථාව සහ එම සංශෝධිත ශිෂ්‍ය සමිති අතුරු ව්‍යවස්ථාව අනුව මෙම විශ්වවිද්‍යාලයේ කළමණාකරණ හා මූල්‍ය පීඨ ශිෂ්‍ය සමිතිය පිහිටුවීමට කටයුතු කරනු ලැබේ.

පීඨ ශිෂ්‍ය සමිතිය සඳහා තෝරා ගත යුතු නිලධාරීන් සංඛ්‍යාව පහත දැක්වේ.

| | | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| සභාපති | - | 01 |
| උපසභාපති | - | 01 |
| ලේකම් | - | 01 |
| සංස්කාරක | - | 01 |
| කණිෂ්ඨ භාණ්ඩාගාරික | - | 01 |
| ශිෂ්‍ය නියෝජිත | - | 08 |

නිලවරණයේදී ඡන්දය පාවිච්චි කිරීමට හෝ ඡන්දය සඳහා ඉදිරිපත් වීමට සුදුසුකම් ලබන සිසුන් පිළිබඳ විස්තර නිවේදන අංක 02 හි සඳහන් වේ.

ලේඛකාධිකාරි
2026.04.21

රුහුණ විශ්වවිද්‍යාලය

සියලුම සිසුන්ගේ දැන ගැනීම සඳහා

නිවේදන අංක 02

**2025/2026 අධ්‍යයන වර්ෂය සඳහා කළමණාකරණ හා මූල්‍ය පීඨ ශිෂ්‍ය සමිතිය සඳහා නාම යෝජනා පත්‍ර භාර ගැනීම.**

මවිසින් 2026.04.21 දිනෙන් නිකුත් කර ඇති 2025/2026 අධ්‍යයන වර්ෂය සඳහා කළමණාකරණ හා මූල්‍ය පීඨ ශිෂ්‍ය සමිතිය වෙනුවෙන් අංක 01 නිවේදනයෙහි දැක්වෙන තනතුරු සහ සාමාජිකත්වය සඳහා නාම යෝජනා පත්‍රය භාර ගැනීම සම්බන්ධයෙනි.

02. රුහුණ විශ්වවිද්‍යාලයේ 1990 අංක 01 දරණ විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිති හා පීඨ ශිෂ්‍ය සමිති අතුරු ව්‍යවස්ථාව හා එම සංශෝධිත ශිෂ්‍ය සමිති අතුරු ව්‍යවස්ථාව අනුව කළමණාකරණ හා මූල්‍ය පීඨ ශිෂ්‍ය සමිතිය සඳහා පහත දැක්වෙන පරිදි නාම යෝජනා භාර ගැනීමේ දිනය.වේලාව.ස්ථානය හා නිලවරණ නිලධාරියා පහත දැක්වෙන පරිදි පත්කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

| | |
|---|---|
| දිනය | :- 2026.04.30 |
| වේලාව | :- මධ්‍යහ්න 12.00 දක්වා |
| ස්ථානය | :- කළමණාකරණ හා මූල්‍ය පීඨ කාර්යාලය |
| නිලවරණ නිලධාරියා | :- පීඨාධිපති/ කළමණාකරණ හා මූල්‍ය පීඨය |

03. නාම යෝජනා ඉදිරිපත් කළ යුත්තේ නියමිත ආකෘති පත්‍රයක වන අතර එම ආකෘති පත්‍ර අදාළ පීඨ කාර්යාලයෙන් ලබා ගත හැක.

ශිෂ්‍ය සමිති සහ පීඨ ශිෂ්‍ය සමිති සම්බන්ධයෙන් වන 1990 අංක 01 දරණ අතුරු ව්‍යවස්ථා මාලාවෙන් නාම යෝජනා භාර ගැනීමට අදාළ අවශ්‍ය යයි හැඟෙන විධිවිධාන කිහිපයක් සිසුන්ගේ අවධානය සඳහා පහත දක්වා ඇත.

05 (අ) වගන්තිය - විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යභාවය අත්හිටවනු ලැබ හෝ අදාළ අධ්‍යයන වර්ෂයතුල අධ්‍යයන පාඨමාලාවක් නොහදාරයි නම් හෝ එවැනි ශිෂ්‍යයෙකු නාම යෝජනා පත්‍ර භාරදීමට හෝ යෝජක ස්ථිරත්වයට හෝ සුදුසුකම් නොලබයි.

09 (III) වගන්තිය - අදාල අධ්‍යයන වර්ෂය සඳහා ලියාපදිංචි වී සිටින ශිෂ්‍යයින් පමණක් නාම යෝජනා පත්‍ර ඉදිරිපත් කිරීමට හා යෝජකයන්, ස්ථිරකරුවන් වශයෙන් ඉදිරිපත් වීමට සුදුසුකම් ලබයි. යෝජකයන් සහ ස්ථිරකරුවන් තමන් විසින් නම් කරනු ලබන අපේක්ෂකයන් අයත් පීඨයන්හි ලියාපදිංචි උපාධි අපේක්ෂකයන් විය යුතුය.